ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

වාර්ෂික වාර්තාව හා ගිණුම්

2011

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව,
තැ.පෙ.1382,
130, ඩබ්ලිව්.ඒ.ඩී.රාමනායක මාවත,
කොළඹ - 03.

ලේකම්තුමා,
රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය,
561/3, ඇල්විටිගල මාවත,
කොළඹ 05.

මහත්මයානනි,

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව
2011 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව හා ගිණුම්

1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(1) වගන්තියේ නියමයන්ට අනුකූලව පහත සඳහන් ලියකියවිලි සමඟ 2011 වර්ෂය සඳහා සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වර්තාව සතුටින් ඉදිරිපත් කරමි.

(අ) 2011 වර්ෂය මූල්‍ය වාර්තා
(ආ) විගණකාධිපති වාර්තා සහ
(ඇ) යථෝක්ත (ආ) පිළිබඳ මණ්ඩලයේ නිරීක්ෂණ

මෙයට,
ඔබ විශ්වාසී වූ,

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්

සභාපති

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

අන්තර්ගතය	පිටු අංකය
01. අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව	01-05
02. ආයතන තොරතුරු	06
03. මානව සම්පත් පිරිස් බලය	07-08
04. ගණකාධිකරණ ප්‍රතිපත්ති	09-12
05. ශේෂ පත්‍රය - 2011	13
06. ආදායම් ප්‍රකාශය - 2011	14
07. හඳුනාගත් ලාභ හා පාඩු පිළිබඳ ප්‍රකාශය	15
08. මුදල් ප්‍රවාහ ප්‍රකාශය	16-17
09. ගිණුම් පිළිබඳ සටහන්	18-22
10. විගණන කමිටුවේ වාර්තාව	23
11. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම	24-37

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව
2011 වර්ෂය සඳහාවූ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ වාර්තාව

1.0 පසුබිම

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව ශ්‍රී ලංකාවේ සිමෙන්ති කර්මාන්තයේ පුරෝගාමියා වේ.

1950 වර්ෂයේදී කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරන ලද කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්ත ශාලාව 1955 අංක 19 දරන රාජ්‍ය අනුග්‍රහය ලත් සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1956 වර්ෂයේදී රාජ්‍ය සංස්ථාවක් බවට පරිවර්තනය කරන ලදුව කන්කසන්තුරේ සිමෙන්ති කම්හල නමින් ප්‍රතිෂ්ඨාපිත කරන ලදී.

ඉන් පසුව 1957 අංක 49 දරන කාර්මික සංස්ථා පනත යටතේ 1959 ජනවාරි 01 වන දා සිට ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය නමින් ප්‍රතිෂ්ඨාපිත කෙරිණි.

1980 වර්ෂයේදී අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද නිවේදනයක් මගින් එහි නම ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව වශයෙන් සංශෝධනය කරන ලදී. කර්මාන්ත හා විද්‍යාත්මක කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ මෙම සංස්ථාව 1985 පෙබරවාරි 01 වන දින සිට පලාත් පාලන,නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය වෙත පවරන ලදී. ඉන්පසුව 1997 ජූනි 19 සිට කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතට සංස්ථාව පත්කරන ලදුව 2010 අප්‍රේල් මස දක්වා අඛන්ඩව එම අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන අවුත් ඉන්අනතුරුව රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතට පත්කරන ලදී.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, සීමාසහිත ලංකා සිමෙන්ති සමාගමේ රු. 1,083,618,910 ක් ආයෝජනය කර ඇති අතර එම සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙන් 62.45% ක් හිමිකරගන ඇත. කොටසක සම මිල රු. 10/- වේ. කෙසේ වුවද මෙම කොටස් මිල 2009, 2010 කාලය තුල සැලකිය යුතු ලෙස ඉහල ගොස් ඇත්තේ උතුරු ප්‍රදේශයේ පැවති අර්බුධකාරී තත්වයන් පහව යාමේ ප්‍රතිඵලයක් ලෙසය. මෙම කොටස් වල උපරිම වෙළඳපළ අගය ලෙස රු. 34.75 සටහන් වූ අතර වර්ෂ 2011 දී මෙම කොටස් වල වටිනාකම රු. 26.20 දක්වා පහළ වැටුනි.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට සීමාසහිත ලෆාර්ජ් මහවැලි මෙරීන් සිමෙන්ති සමාගමේ එකක් රු.10/- බැගින් වූ සාමාන්‍ය කොටස් 320,000/- ක් හිමිව ඇති අතර, 1995 දෙසැම්බර් 31 දින සංස්ථාව සතුව තිබූ සෑම කොටස් දෙකකටම එක් සාමාන්‍ය කොටස

බැගින් ප්‍රසාද කොටස් නිකුත් කිරීම තුලින් වාසියක් ලැබීම නිසා දැනට සීමාසහිත මහවැලි මෙරීන් සිමෙන්ති සමාගමේ සාමාන්‍ය කොටස් 480,000ක් සංස්ථාව සතුව පවතී. එය මුළු කොටස් හිමිකමෙන් 10%ක් වේ. මෙම ආයෝජනයෙන් සිමෙන්ති සංස්ථාව 1999 තෙක් ඉතා ඉහල ප්‍රතිලාභයක් (ලාභාංශ) ලබා ඇත. ඉන් අනතුරුව වසර 2004 හැර ලෆාර්ජ් මහවැලි සිමෙන්ති සමාගමෙන් කිසිදු ප්‍රතිලාභයක් සංස්ථාව ලබා නැත.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතුව තිබූ පුත්තලම සිමෙන්ති කම්හල සහ රුහුණු සිමෙන්ති කම්හල ජනතාකරණයට භාජනය වීමත්, මට්ටක්කුලියේ පිහිටි කඩදාසි මලු ඒකකයේ අයිතිය මහා භාණ්ඩාගාරයට මාරු කිරීම නිසාත්, දැනට සංස්ථාව සතුව පවතින්නේ උතුරේ ආරක්‍ෂක තත්වය මත 1990 ජුනි මාසයේ සිට අක්‍රියව පවතින කන්කසන්තුරේ සිමෙන්ති කම්හල පමණි. කන්කසන්තුරේ සිමෙන්ති කම්හලේ සේවා නියුක්ති සේවකයින්ට වැටුප් ගෙවීම 2001 මාර්තු මාසය දක්වා මහා භාණ්ඩාගාරයෙන් කරන ලද නමුත් 2001 අප්‍රේල් මස සිට එය අත් හිටුවන ලදී. සංස්ථාව මුහුණ පා ඇති අතිවිශාල අර්බුදය වන්නේ මෙම සේවක වැටුප් සඳහා මුදල් සොයා ගැනීමයි.

2003 සහ 2005 යන වර්ෂයන්හි රජය විසින් ස්වෙච්චා විශ්‍රාම යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාම යන ලදී. පිළිවෙලින් සේවකයින් 173ක් සහ 21ක් විශ්‍රාම ගන්නා ලදී. මහාභාණ්ඩාගාරය විසින් මෙම විශ්‍රාම ගැන්වීම සඳහා පිලිවෙලින් රු.මිලියන 49.18 ක් සහ 8.51ක් ලබා දෙන ලදී.

2.0 වර්තමාන තත්ත්වය

(අ) සිමෙන්ති අලෙවිය :

අවම මිලකට, ඉහළ ගුණත්වයකින් යුතු වු සිමෙන්ති අවසාන පාරිභෝගිකයා වෙත සැපයීම සංස්ථාවෙහි මෙහෙවර වන අතර, සංස්ථාව 2008 වසරෙහි අගභාගය වන විට සිමෙන්ති වෙළෙඳපොලට ඇතුල්වීමත්, සමග 2009 වසරේදි එම තත්ත්වය ලගාකර ගැනිමට හැකිව තිබුණි. 2009 වසර තුලදි සිමෙන්ති මෙට්ට්‍රික් ටොන් 84,308 ක් සංස්ථාව විසින් පකිස්ථානයෙන් ආනයනය කර ඇති අතර, එය “කන්කේසන්” යන වෙළඳනාමයෙන් වෙළඳපල තුල බෙදා හරින ලදි. 2010 වසර තුළදී සාමාන්‍ය පෝට්ලන්ඩ් සිමෙන්ති මෙට්‍රික් ටොන් 36260 ක් “කන්කේසන්” යන වෙළඳ නාමය යටතේ සංස්ථාව විසින් පාකිස්ථානයෙන් ආනයනය කරන ලදී. 2011 වසර තුළදීද සාමාන්‍ය පෝට්ලන්ඩ් සිමෙන්ති මෙට්ට්‍රික් ටොන් 58352 ක් ආනයනය කරන ලදී.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සිමෙන්ති වෙළෙඳපොලට පිවිසීමත් සමඟම පෞද්ගලික අංශයෙහි සිමෙන්ති කර්මාන්තය සඳහා සම්බාධක පැනවීම තුලින් සංස්ථාව මෙම දිනවල වාසි/සහන ලබාගෙන තිබෙන අතර, විවිධ ප්‍රතිපත්ති දියත් කිරිම හරහා මිල ගනන් අඩු කිරිම තුලින් අඩුවන ඉල්ලුම සඳහා විකල්ප උපායමාර්ග මගින් ලාභදායිත්වය ඉහල නංවා ගැනිමට පියවර ගෙන තිබෙයි.

කෙසේ වුවත් සිමෙන්ති අලෙවි ක්‍රියාවලියෙන් සංස්ථාව මූල්‍යමය ප්‍රතිලාභයක් ලැබීමට නොහැකි වූයේ අනෙකුත් තරඟකාරි ආයතන වලින් එල්ල වූ බොහෝ බාධක නිසාය.

(ආ) කොන්ක්‍රිට් නිපැයුම් නිෂ්පාදනය හා අලෙවිය :

1997 ඔක්තෝබර් මාසයේදි සංස්ථාව විසින්, කොන්ක්‍රිට් නිෂ්පාදනය උරුම්පිරායිහි ආරම්භ කර තිබේ. මෙම ඒකකය ප්‍රධාන වශයෙන් ලංකා විදුලිබල මණ්ඩලය සහ ශ්‍රී ලංකා ටෙලිකොම් යන ආයතන සඳහා කොන්ක්‍රිට් රැහැන් ආධාරක කණු නිෂ්පාදනයෙහි යෙදි ඇත. කෙසේ වුවද වර්ෂ 2006 මැද භාගයේ සිට 2008 මුල් භාගය වන තුරු මෙකී නිෂ්පාදන දැනට පවතින වාතාවරණය සහ අමුද්‍රව්‍ය සපයාගැනිමේ අපහසුතාවය හේතුවෙන් අඩු කිරීමට සිදුවිය.

2009 වසරේදි සම්පූර්ණ නිෂ්පාදනයක් පැවති අතර 3312 පමණ වු ආධාරක කණු නිපදවා ලංකා විදුලිබල මණ්ඩලයට හා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට සපයන ලදි. කොන්ක්‍රිට් ගල්වලට අමතරව තලාංඳ පදික වේදිකා ඇතුරුම්, කම්බි කණු යනාදිය ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, මාර්ග සංවර්ධන අධිකාරිය, යාපනය විශ්ව විද්‍යාලට සහ සාමාන්‍ය මහජනතාව වෙත නිකුත් කරන ලදි. වර්ෂ 2010 දි පූර්ණ නිෂ්පාදනයේ ප්‍රතිඵලයක් ලෙස

කොන්ක්‍රිට් කනු 2117 ක් ද ‘‘පන්නල්’’ කණු 4505 නිපදවීමට හැකිවූ අතර 2011 වසරේදී ද කොන්ක්‍රිට් කණු 1918 ක් සහ ‘‘පන්නල්’’ කණු 1892 ක් නිපදවන ලදී. මෙම ක්‍රියාවලිය හේතුවෙන් සේවකයන් 69 දෙනෙකුට ආදායම් උපදවන හා දැනට ශ්‍රම බලකාය ශක්තිමත් කිරිමටත් සමත් වී ඇත.

3.0 ලාභදායිත්වය :

වර්ෂ 2009 දි රු මිලියන 1.07 ක ආදායමක් සංස්ථාව වෙත ලැබී තිබේ. කෙසේ නමුත්, වැළැක්විය නොහැකි සාධක මත සංස්ථාවේ මෙහෙයුම් කටයුතු අලාභදායි තත්ත්වයට පත්විය. තවදුරටත් සංස්ථාව කල්බදුකරණය තුලින් ලැබෙන කුලිය සහ තැන්පතු තුලින් ලැබෙන පොලි වැනි වෙනත්, මෙහෙයුම් ආදායම් රු. මිලියන 28.8 ක් ඉපයිය.

2009 වසරේදී සංස්ථාව රු. මිලියන 79.03 ක ශුද්ධ අලාභයක් සියලු මෙහෙයුම් සහ පරිපාලන වියදම් ඇතුලුව උපයාගෙන ඇත. 2010 වසරේදී සංස්ථාවට බැංකු ණය පොලි අඩු කිරීමෙන් අනතුරුව රු.මිලියන 5.074 ක ශුද්ධ ලාභයක් සංස්ථාව උපයා ගෙන ඇත. 2011 වර්ෂයේදී ද සංස්ථාව රු.මිලියන 2.6 ක ශුද්ධ ලාභයක් උපයාගෙන ඇත.

4.0 ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ අනාගත කාර්ය භාරය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතුව පවතින එකම කම්හල වන කන්කසන්තුරේ සිමෙන්ති කම්හල තාවකාලිකව වසාදමා තිබෙන බැවින් දැනට ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සිමෙන්ති නිෂ්පාදන කටයුතු වල නිරත නොවේ. කෙසේ වුවද නුදුරු අනාගතයේදී කන්කසන්තුරේ සිමෙන්ති කම්හලේ නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කරිමේ ප්‍රවනතාවය පිළිබඳව පුරෝකථනයක් ගැන අනාවැකි කිමද අපහසුය.

සංස්ථාවේ මූලික වගකීම වන්නේ කන්කේසන් සිමෙන්ති කම්හල නැවත ආරම්භ කිරීමේ කාර්යය සහතික කිරීමය. මෙම කරුණ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂවල යම් උත්සාහයන් දරන ලද අතර, එහිදි නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරිමට ඇති හැකියාව පිළිබඳ විස්තිර්ණ අධ්‍යයනයක යෙදුනි. අවශ්‍ය වාර්තා ඉදිරිපත් කෙරුණු අතර, කම්හලේ ආරක්‍ෂාව පිලිබඳව පූර්ණ සහතිකයක් ලැබුණහොත් ඒවා ක්‍රියාත්මක කිරිමට ශක්‍යතාවක් ඇති තත්වයක පවත්නා බවට කරුණු හෙලිවින.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ කලමනාකාරිත්වය නව සිමෙන්ති ඇසුරුම් යන්ත්‍රාගාරයක් සුදුසු ප්‍රදේශයක මෙම වසරතුලදි ආරම්භ කිරිමට අවශ්‍ය කටයුතු සංවිධානය කරමින් පවති. මෙහිදි

අඩු පිරිවැයකට උසස් ගුණාත්මක බැවින් යුතු සිමෙන්ති මහජනතාවට සැපයීම සංස්ථාවේ මූලික අරමුණ වී තිබේ.

පුත්තලම පලාවී සිමෙන්ති කර්මාන්තශාලාව ආශ්‍රිතව ඇති කැලෑබද ඉඩමේ කජු වගා කිරීමට යෝජනාවක් ඉදිරිපත් කර ඇත. පොලිස් දෙපාර්තමේන්තුවෙන් සංස්ථාව වෙත පවරා ගන්නා ලද කොළඹ 03, ගාලුපාරෙහි අංක 287 හි පිහිටි සංස්ථාව සතු ඉඩම සඳහා බැංකු වලින් ලබාගන්නා මූලය ප්‍රතිපාදන වන මහල් 25කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් සකස් කර ඇත, මේ සඳහා වූ වාස්තු විද්‍යාත්මක නිර්මාණයකට අනුව මුල් මහල් 04 රථ ගාල් සඳහා ඉතිරි මහල් මනාසේ උද්‍යාන අලංකරණය කළ මහල් ගොඩනැගිල්ලක් වශයෙන් නිම කිරීමට රු. බිලියන 4500 ක් ඇස්තමේන්තු කර ඇත.

5.0 සේවය ඇගයීම

වර්ෂ 2011 දී ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ උන්නතිය, සංවර්ධනය, මෙහෙයුම් කාර්යයන් වෙනුවෙන් ලබා දෙන ලද සහයෝගය හා වටිනා උපදෙස් වෙනුවෙන් කර්මාන්ත සංවර්ධන ගරු අමාත්‍යතුමා, රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන ගරු අමාත්‍යතුමා, රේඛීය අමාත්‍යාංශයේ, මහාභාණ්ඩාගාරයේ, ප්‍රමිති ආයතනයේ, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ, රාජ්‍ය බැංකු, අනෙකුත් රජයේ ආයතන, සිමෙන්ති නිෂ්පාදන ආයතන යන ආයතනයන්හි නිලධාරීන්ටත් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ගෞරවනීය ස්තූතිය පුදකර සිටිමු.

එසේම ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ සේවකයන් එහි උන්නතිය හා සංවර්ධනය වෙනුවෙන් ලබා දෙනු ලැබූ සේවයද අගය කරන බව සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී.

<u>සංස්ථාව පිළිබඳ තොරතුරු</u>

ලියාපදිංචි ප්‍රධාන කාර්යාලය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව,
තැපැල් පෙට්ටිය 1382,
අංක 130, ඩබ්ලිව්.ඒ.ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

දුරකථන අංක : 2440201, 2440211, 2440212

ෆැක්ස් අංකය: 2448866

පාලිත සමාගමේ ලියාපදිංචි කාර්යාලය

සීමාසහිත ලංකා සිමෙන්ති සමාගම
7වන මහල,රාජ්‍ය ඉංජිනේරු සංස්ථා ගොඩනැගිල්ල,
130, ඩබ්ලිව්.ඒ.ඩී.රාමණායක මාවත,
කොළඹ 02.

දුරකථන අංක : 2447746, 254158

<u>කම්හල</u>

කන්කේසන් සිමෙන්ති කම්හල
කන්කසන්තුරේ

දුරකථන අංකය : 021-3215340
021-3215341

<u>කම්හල</u>

කිරමලේ පාර,
කන්කසන්තුරේ

<u>කොන්ක්‍රීට් ව්‍යාපෘතිය, යාපනය.</u>

සිමෙන්ති කම්හල,
කන්කසන්තුරේ.

දුරකථන අංක : 021-3215340/41

<u>සිමෙන්ති ගබඩාව</u>

472, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ.

දුරකථන අංක :011-3030041 **ෆැක්ස් :**011-4923959

<u>බැංකුකරුවෝ</u>

මහජන බැංකුව
ලංකා බැංකුව
සීමාසහිත කොමර්ෂල් බැංකුව

<u>විගණකවරු</u>

රාජ්‍ය විගණකාධිපති
කොළඹ 07

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

2011 වසර සඳහා පහත දැක්වෙන අධ්‍යක්ෂකවරුන් කළමනාකරන මණ්ඩලය ලෙස පත්කර ඇත.

01.	ලෙස්ලි වීරමන්ත්‍රි මහතා	සභාපති	2009.10.06	
02.	ලෙස්ලි වීරමන්ත්‍රි මහතා	සභාපති	2010.02.12	ඉල්ලා අස්විය.
03.	එස්.ජේ.පරණගම මහතා	සභාපති	2010.05.24	
04.	ජගත් නාරම්බැද්ද මහතා	ක්‍රියාකාරි අධ්‍යක්ෂක	2010.05.26	
05.	අසෝක කොඩිතුවක්කු මහතා	අධ්‍යක්ෂ	2010.05.26	
06.	ඩබ්ලිව්.ජේ.හඳපාන්ගොඩ මහත්මිය	අධ්‍යක්ෂ	2010.06.08	
07.	කේ.කේ.පියසේන මහතා	අධ්‍යක්ෂ	2010.06.08	
08.	එස්.එම්.පියතිස්ස මහතා	අධ්‍යක්ෂ	2010.07.05	

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුව

01	එස්.සෙල්වකුමාර් මහතා	ගණකාධිකාරි (වැඩ බලන)	ප්‍රධාන කාර්යාලය
02	පී.එස්.ඩී.ප්‍රනාන්දු මහත්මිය	විගණන නිලධාරි (වැඩ බලන)	ප්‍රධාන කාර්යාලය
03	පී.විමලදාස්	සහකාර ඉංජිනේරු(කොන්ක්‍රීට් ව්‍යාපෘති)	යාපනය කාර්යාලය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

2011.12.31 දිනට මානව සම්පත් පිරිස් බලය

වර්ගය	ජ්‍යෙෂ්ඨ කළමණාකරන	කණිෂ්ඨ කළමණාකරන	කළමණාකරන සහකාර	ප්‍රාථමික මට්ටම	එකතුව
ප්‍රධාන කාර්යාලය	02	02	13	09	26
	-	01	-	-	01
යාපනය කාර්යාලය	-	-	07	06	13
කොන්ක්‍රීට් ව්‍යාපෘතිය	-	-	02	27	29
එකතුව	02	03	22	42	69

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

ගණකාධිකරණ ප්‍රතිපත්ති

01. පොදු ගණකාධිකරණ ප්‍රතිපත්ති :

සංස්ථාවේ ගණකාධිකරණ ප්‍රතිපත්ති පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්මවලට අනුකූලය. ගිණුම් වලට බලපානු ලබන උද්ධමනකාරී සාධක සම්බන්ධයෙන් ගැලපීම් කර නොමැත.

2.0 විදේශ විනිමය පරිවර්තනය :

සියලු විදේශ ගණුදෙනු පරිවර්තනය කර ඇත්තේ ගණුදෙනු ක්‍රියාත්මකවූ අවස්ථාවේ පැවති විනිමය අනුපාත අනුවය.

3.0 වත්කම් හා ඒවා තක්සේරු කිරීමේ පදනම :

3.1 ස්ථාවර වත්කම් හා ක්ෂයවීම් :

ස්ථාවර වත්කම් පිරිවැය අනුව හෝ තක්සේරුව අනුව සමස්ථ ක්ෂය අඩුකර ප්‍රකාශිතය.

3.2 ක්ෂයවීම් :

මුලු පරිවැය හෝ සෘජු රේඛීත ක්‍රමයක් මත ගණන් බැලූ වටිනාකම, වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය අවසානයේදී එම වත්කම් ලේඛණ වලින් ඉවත් කිරීම පදනම් කර ගෙන ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

3.3 වත්කම් මිලදී ගත් වර්ෂය තුල ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන සලසා නොමැත.

3.4 සින්නක්කර ඉඩම් සඳහා ක්ෂයවීම් ප්‍රතිපාදන සලසා නැත.

3.5 ක්ෂයවීම් සඳහා අය කිරීම් අනුපාතයන් පහත සඳහන් පරිදි වේ.

ගොඩනැගිලි	6.67%
පරියත හා යන්ත්‍රෝපකරණ	12.5%
පස් කපන හා බර උපකරණ	25.0%
මොටර් වාහන	25.0%
සවිකිරීමේ නොකල මෙවලම් සහ චංචල උපකරණ	25.0%
සවිකිරීමේ උපාංග සහ ගෘහ භාණ්ඩ	25.0%
දුම්රිය සහ මාර්ග	10.0%

3.6 **ප්‍රාග්ධනීකරණය**

වටිනාකම රු.10,000/- කට අඩු මෙවලම්, සවිකිරීම්, සහ උපාංග ප්‍රාග්ධනිකරණය නොකර ඇති අතර, ඒ වෙනුවට මිලදී ගත් වර්ෂයේ ලාභ අලාභ ගිණුමට අය කෙරෙන ලෙස දක්වා ඇත.

3.7 **ආයෝජන**

වාර්තාගත වන කොටස් මිලගණන්හි උච්චාවචනයන් හේතුවෙන්, ලැයිස්තුගත සමාගම්හි කොටස් වල කෙරෙන දිගුකාලීන ආයෝජනයන්හි කොටස් මිල ගණන් නාමික අගයට හෝ පිරිවැයට පවත්වා ගෙන යනු ලබයි.

කෙටි කාලීන ආයෝජනයන් වෙළෙඳ පල වටිනාකමට පවත්වා ගෙන යාම සඳහා නියම කර ඇත.

3.8 **තොග සහ කෙරෙමින් පවතින වැඩ**

තොග සහ කෙරෙමින් පවතින වැඩ, ගත් මිල අනුව හෝ ශුද්ධ උපලබ්ධි අගයට තක්සේරු තක්සේරු කරනු ලබයි.

3.9 **ණයගැතියෝ :**

බොල් ණය සහ අඩමාන ණය වෙනුවෙන් ප්‍රතිපාදන අඩුකොට ඉන්වොයිස් වටිනාකම අනුව වෙළඳ හා විවිධ ණයගැතියෝ දක්වා ඇත.

4.0 බැරකම් හා ප්‍රතිපාදන :

4.1 පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

1983 අංක. 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ගෙවිය යුතු වන පාරිතෝෂික වෙනුවෙන් සම්පූර්ණ ප්‍රතිපාදන සලසා ඇත.

4.2 සම්භාව්‍ය බැරකම් :

ශේෂ පත්‍රයේ දිනයට පවතින සම්භාව්‍ය බැරකම් සඳහා ගිණුම් වල ප්‍රතිපාදන සලසා නැති අතර ඒවා පිළබඳ විස්තර ගිණුම් වලට අදාල සටහන් වලින් අනාවරණය කර ඇත.

4.3 කෙටිකාලින බැරකම්

මාස 12 ක පමණ, කෙටි කාලයක් සඳහා ලබා ගෙන ඇති කෙටි කාලින ණය පහසුකම් ලෙස සියලුම ගෙවීම්, ආනයන සඳහා වූ බැංකු ණය, බැංකු අයිරා පහසුකම් හදුනාගත හැක.

4.4 දිගුකාලින බැරකම්

මාස 12 කට වඩා වැඩි කාලයක් තුලදි ගෙවිම සඳහා ලබාගෙන ඇති සියලුම බැරකම් දිගුකාලින බැරකම් වේ.

0.5 ලාභ සහ අලාභ

5.1 පිරිවැටුම :

වීරිවැටුමෙන් පෙන්නුම් කරනු ලබන්නේ පාරිභෝගිකයන්ට කල විකුණුම් සහ සංස්ථාවේ අභ්‍යන්තර පරිභෝජන අදහසින් කරන ලද විකුණුම්ය.

5.2 විකුණුම් පිරිවැය

ගැනුම් පිරිවැය, රක්ෂණ වියදම්, ප්‍රවාහන පිරිවැය ඇතුලත් ආනයනික පිරිවැය, රේගු ගාස්තු, ශ්‍රී ලංකා වරාය අධිකාරි ගාස්තු, නැව් සේවා ගාස්තු, බහාලුම් ඇසුරුම් ගාස්තු, ප්‍රවාහන ගාස්තු, පැටවීමේ හා බෑමේ කුලි, රඳවාගැනීමේ පිරිවැය, මූල්‍ය පිරිවැය, තොග හානි වීම් පිරිවැය, තොග හිගවීමේ පිරිවැය සහ වෙනත් සෘජු පිරිවැයන්ගෙන් විකුණුම් පිරිවැය සමන්විත වේ.

5.3 වියදම්

වර්ෂයක් තුලදි දරන ලද හා ගෙවීම සඳහා බැදි සිටින සියළුම පරිපාලන, නිෂ්පාදන හා අලෙවිකරණය හා සම්බන්ධවන සියළුම වක්‍ර වියදම් අන්තර්ගත වේ.

5.4 ආදායම් බදු ගෙවීමෙන් පසු ලාභය

සංස්ථාවේ ආදායම් බද්දෙන් පසු ලාභය තීරණය කර තිබෙන්නේ, බොල්ණය සහ අඩමාන ණය හෙලිදරව් වූ සියලුම බැරකම්, තොග ගැලපීම සහ ස්ථාවර වත්කම් ක්ෂය වීම සඳහා ප්‍රතිපාදන සැලැස්මෙන් පසුවය.

එමෙන්ම ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමෙන් සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂමව පවත්වාගෙන යාමේදි දරන ලද සියලු වියදම් අයකර ගැනිමෙන් පසුවය.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

2011 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ශේෂ පත්‍රය

	සටහන	2011 '000	2011 '000	2010 '000	2010 '000
වත්කම්					
ප්‍රවර්තනය නොවන වත්කම්					
දේපළ, යන්ත්‍ර හා උපකරණ	1	550,705		543,939	
කාලීන ලැබිය යුතු	2	757,224		757,224	
පාලිත සමාගම් වල ආයෝජන හා වෙනත්	3	1,090,019		1,090,019	
වෙනත් මූල්‍ය වත්කම්		25,526		68,123	
			2,423,474		2,459,304
ප්‍රවර්තන වත්කම්					
තොගය	4	20,532		28,689	
වෙළඳ හා වෙනත් ලැබිය යුතු	5	76,972		119,074	
පූර්ව ගෙවීම්		1,248		589	
මුදල් හා මුදල් සමක	6	14,071		9,762	
			112,823		158,114
මුළු වත්කම්			2,536,297		2,617,418
පොලී රහිත යෙදවුම් හා වගකීම්					
ප්‍රාග්ධනය හා සංචිත					
නිකුත් කරන ලද ප්‍රාග්ධනය		966,972		966,972	
සංචිත		9,997		9,997	
ප්‍රත්‍යාගණන සංචිත		536,119		536,119	
සමුච්චිත ලාභ/අලාභ		372,864		372,219	
			1,885,952		1,885,307
අඩුකල පොලී					
ප්‍රවර්තන නොවන වගකීම්	7	492,426		492,426	
පොලී ගෙවන ණය					
විලම්භිත බදු					
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්		18,919		18,783	
			511,345		511,209
ප්‍රවර්තන වගකීම්					
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු	8	62,857		61,730	
කෙටිකාලීන ණය				45,958	
පොලී ගෙවන ණය වල ජංගම කොටස		53,665		101,817	
හොල්සිම් සමාගමෙන් ලද අත්තිකාරම්		22,478		11,398	
			139,000		220,902
මුළු යෙදවුම් හා වගකීම්			2,536,297		2,617,418

------------------------- ---------------------- --------------------

ගණකාධිකාරී ක්‍රියාකාරී අධ්‍යක්ෂක සභාපති

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ආදායම් ප්‍රකාශය

	සටහන්	2011 '000	2010 '000
ආදායම්	09	656,071	410,709
විකුණුම් පිරිවැය	10	656,676	(406,507)
දළ ලාභය		(605)	4,201
අනෙකුත් මෙහෙයුම් ආදායම්	11	35,623	34,846
බෙදාහැරීමේ පිරිවැය	12	-	-
පරිපාලන පිරිවැය	13	(28,423)	(29,131)
අනෙකුත් මෙහෙයුම් වියදම්	14	(3,995)	(4,842)
මෙහෙයුම් වලින් ලාභය		2,600	**5,074**
මූල්‍ය පිරිවැය		-	-
ආශ්‍රිතයන්ගේ ආදායම්		-	-
බදු පෙර ලාභය		2,600	5,074
ආදායම් බදු වියදම			
බදු පසු ලාභය		2,600	5,074
සුළු පරිමාණ පොලි			
සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලින් ශුද්ධ ලාභය අතිවිශේෂ අයිතමයන්		**2,600**	**5,074**
භාණ්ඩාගාර ප්‍රදාන	15		-
වැටුප්,වේතන,සේවක,අර්ථසාධක,සේවක			-
භාරකාර අරමුදල් සහ විශ්‍රාම පාරිතෝෂික			-
ස්වෙච්ජා,විශ්‍රාම වන්දි සහ විශ්‍රාම පාරිතෝෂික			-
අදාල කාලය සඳහා ශුද්ධ ලාභය/ (අලාභය)		**2,600**	**5,074**

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

2011 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

	ප්‍රාග්ධන සංචිත '000	ප්‍රත්‍යාගනන සංචිත '000	සාමාන්‍ය සංචිත '000	රඳවාගත් ලාභය '000
2006 දෙසැම්බර් 31 දිනට ශේෂය	966,972	-	9,997	460,342
මෙම වර්ෂය (2007) පෙර වර්ෂය හා සම්බන්ධ ගැලපිම	-	536,119	- -	(22,323) -
2007 දෙසැම්බර් 31 දිනට ශේෂය	966,972	536,119	9,997	(438,019)
මෙම වර්ෂය (2008) පෙර වර්ෂය හා සම්බන්ධ ගැලපිම්	- -	- -	- -	(8,498) -
2008 දෙසැම්බර් 31 දිනට ශේෂය	966,972	536,119	9,997	446,517
මෙම වර්ෂය (2009) පෙර වර්ෂය හා සම්බන්ධ ගැලපිම්	- -	- -	- -	(79,373) -
2009 දෙසැම්බර් 31 දිනට ශේෂය	966,972	536,119	9,997	367,144
මෙම වර්ෂය (2011) පෙර වර්ෂය හා සම්බන්ධ ගැලපිම්	- -	- -	- -	(5,074) -
2010 දෙසැම්බර් 31 දිනට ශේෂය	966,972	536,119	9,997	372,218
මෙම වර්ෂය (2010) මෙම වර්ෂය හා සම්බන්ධ ශේෂය	- -	- -	- -	2,600 -
2011 දෙසැම්බර් 31 දිනට ශේෂය	966,972	536,119	9,997	374,818

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව
මුදල් ප්‍රවාහ ප්‍රකාශය 2011
දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා

	2011		2010	
	රු. '000	රු. '000	රු. '000	රු. '000
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය				
ශුද්ධ මෙහෙයුම් ලාභය (සටහන I)		182		63
මුදල් චලනයන් අන්තර්ගත නොවන අයිතමයන් සඳහා ගැලපිම් ලාභ/අලාභ				
ක්ෂය වීම්	560		672	
විශ්‍රාම පාරිතෝෂිකය සඳහා ගැලපිම්	1385		3,130	
		1,945		3,802
පූර්වකාල අයිතමයන්				
කාරක ප්‍රාග්ධනයට අදාල අයිතමයන් වෙනස්කම් වලට පෙර මෙහෙයවූ ලාභ/අලාභ		2,127		3,865
කාරක ප්‍රාග්ධන අයිතමයන්ගේ වෙනස්කම්				
තොගය - වැඩිවීම/අඩුවීම	14,809		9,898	
ණයකරුවන් හා තැන්පතු (වැඩිවීම/අඩුවීම)	(76,971)		(44,341)	
පූර්වගෙවීම් (වැඩිවීම/අඩුවීම)	1247		244	
ගෙවිය යුතු ගිණුම් (වැඩිවීම/අඩුවීම)	(1,124)		(1,631)	
දිමනා (එම)				
		(59,664)		(35,830)
		(57,664)		(31,965)
අඩුකලා	-			
ගෙවූ ආදායම් බදු	-			
ගෙවූ පාරිතෝෂික	(1,249)	(1,249)	(5,063)	5,063
		(58,913)		(35,423)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ඉපයූ පාවිච්චි කළ ශුද්ධ මුදල				
ආයෝජන ක්‍රියාකරකම් වලින් මුදල් ප්‍රවාහ				
ස්ථාවර වත්කම් ලබා ගැනීම				
ප්‍රාග්ධන ගිණුම් වල ගැලපීම	-			
ස්ථාවර වත්කම් බැහැරලීම	-			
ලාභාංශ				
තැන්පතුවලින් ලත් පොලී	2,418		5,011	
භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන	(525)		(24,832)	
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ඉපැයූ ශුද්ධ මුදල්		(644)		(19,821)
මූල්‍ය ක්‍රියාකරකම් වලින් මුදල් ප්‍රවාහ ගෙවූ පොලිය	10,236		16,006	
ආර්.ආර්.ඒ.එන්. ගෙන් ප්‍රධාන බැංකු ණය සහ අයිරා	53,665		26,291	
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් පාවිච්චි කල ශුද්ධ මුදල		63,901		42,297
ශුද්ධ මුදල් හා මුදල් සමකවල ශුද්ධ (අඩුවීම/වැඩිවීම)		9,729		-
වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමක (සටහන් I)		-		3,220
වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් සමක (සටහන් II)		14,071		9,727

සටහන - I	රු.000	රු.000	රු.000	රු.000
පොලි ගෙවීමෙන් පසු බද්දට පෙර ශුද්ධ ලාභය	(2,600)		5,074	
එකතු කළා :-				
ගෙවූ පොලි -		2,600		5,074
අඩු කලා :-				
ලාභාංශ				
තැන්පතු වලින් ලද ලාභය	(2,418)		(5,011)	
		(2,418)		(5,011)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලාභය		182		63

සටහන - II	2010 දෙසැම්බර් 31 දිනට
	රු.000
බැංකුවේ මුදල් (ප්‍ර.කා)	9,415
බැංකුවේ මුදල් (කංකසන්තුරේ)	312
අතැති මුදල්	-
බැංකු අයිරාව	-
වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමක	9,727
	2011 දෙසැම්බර් 31 දිනට
	රු.000
බැංකුවේ මුදල් (ප්‍ර.කා)	13,818
බැංකුවේ මුදල් (කංකසන්තුරේ)	253
අතැති මුදල්	-
බැංකු අයිරාව	-
වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමක	14,071

සටහන

මෙම මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති අංක 09ට අනුකූලව පිළියෙල කර ඇති අතර, වක්‍ර ක්‍රමයට ඉදිරිපත් කර ඇත.

සටහන (1) ස්ථාවර වත්කම් ලේඛණය

විස්තරය	2011.01.01 දිනට මූලික විටිනාකම රු.	වර්ෂය තුලදී මිලදී ගැනීම් රු.	වර්ෂය තුලදී අපහරණය රු.	2011.12.31දිනට වටිනාකම රු.
ඉඩම් හා ගොඩනැගිලි	538,003,481	-	-	538,003,481
මෝටර්රථ	11,839,320	6,650,714	-	18,490,034
ගෘහ භාණ්ඩ,තිරවුරු හා සවිකරම්රි	4,560,440	656,336	-	5,216,776
උපකරණ හා චංචල ආම්පන්න	1,052,393	20,930	-	1,073,323
එකතුව	**555,455,634**	**7,327,980**	**-**	**562,783,614**

<u>අඩු කළා : සමුච්චිත ක්ෂය</u>				
ඉඩම් හා ගොඩනැගිලි	207,421	20,742	-	228,163
මෝටර් වාහන	7,425,650	147,813	-	7,573,463
ගෘහ භාණ්ඩ,තිරවුරු හා සවිකිරීම්	2,863,843	390,368	-	3,254,211
උපකරණ හා චංචල ආම්පන්න	1,019,611	2,850	-	1,022,462
එකතුව	11,516,526	561,773	-	12,078,299
2011.12.31 දිනය ශුද්ධ වටිනාකම				**550,705,315**

අක්කර 221 ක් වු පුත්තලම පලාවිහි පිහිටා ඇති කැලෑ බද ඉඩම නැවත තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර ඇති අතර, එය ඉටු වු වහාම අදාල ගිණුම් වලට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.

2010	සටහන (2) දීර්ඝ කාලීනව ලැබිය යුතු රු.757,223,883/=	2011
424,169,977	ලංකා සිමෙන්ති සමාගම බිහි කිරීමට කෙටිකාලීන සහ දිගු කාලීන ණය	424,169,977
333,053,906	කර්මාන්ත ශාලා දෙකම වැසීමට පෙර ලංකා සිමෙන්ති සමාගම සහ ශ්‍රී ලංකා	333,053,906
757,223,883	සිමෙන්ති සංස්ථාව අතර අභ්‍යන්තර ගනුදෙනු.	757,223,883
	සටහන (3) පාලිත සමාගම්වල හා වෙනත් ඒවායේ ආයෝජනය රු. 1,090,018,910	
	ශේෂපත්‍ර දිනට ලංකා සිමෙන්ති සමාගමේ කොටසක වෙළඳපෙළ වටිනාකම රු.23.25 කි. 2011 වසරේදී කොටසක අගය ස්වල්ප වශයෙන් වැඩි වූ අතර එහි උපරිම අගය රු.34ක් විය.	
	පාලිත සමාගම - ලංකා සිමෙන්ති සමාගම (පී.එල්.සී.)	
1,083,618,910	කොටසක් රු.10/= බැගින් කොටස් 108,361,891 ක 62.45% ක අයිතිය	1,083,618,910
	ලෆාර්ජ් සිමෙන්ති සමාගම	
6,400,000	කොටසක් රු.15/= බැගින් කොටස් 320,000	6,400,000
1,090,018,910	කොටස් 160,000 (1995 ප්‍රසාද නිකුතුව)	1,090,018,910
	සටහන (4) භාණ්ඩ ලැයිස්තුව - රු. 20,531,525	
5,719,777	කන්කේසන් සිමෙන්ති කම්හලට 1990 මිලදී ගත් හා පුත්තලම සිමෙන්ති කම්හලේ ගබඩා කර ඇති අමතර කොටස් තොගය	5,719,777
-	හිස් සිමෙන්ති මලු තොගය	
2,299,315	කොන්ක්‍රීට් නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය සහ කෙරෙමින් පවතින වැඩ	5,349,307
2,010,966	කොන්ක්‍රීට් කණු ඇතුලු නිමි භාණ්ඩ තොගය	9,424,700
18,658,915	සිමෙන්ති තොගය	37,741
28,688,973		20,531,525

2010		2011
	දැනට පවතින තොගයෙහි අඩංගු වනුයේ කන්කසන්තුරේ සිමෙන්ති කම්හලෙහි අමතර තොගය පමණක් වන අතර, අනෙකුත් නැති වූ අයිතමයන් සියල්ල තොග ශේෂයන්ගේ අගයෙන් ලියා හැර ඇත.	
	සටහන (5) - වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ - 76,971,521	
105,540,150	ප්‍රධාන කාර්යාලය	65,401,957
13,483,690	කන්කසන්තුරේ සිමෙන්ති කම්හල (යාපනය කාර්යාලය)	11,569,564
119,073,840		76,971,521
	සටහන (6) - මුදල් හා මුදල් සමාන දෑ - රු.14,071,116	
278,454	මහජන බැංකුව - ජාත්‍යන්තර ශාඛාව	278,454
1,995,615	මහජන බැංකුව - ලිබර්ටි ප්ලාසා	-
222,046	මහජන බැංකුව - වව්නියා ශාඛාව	22,045
312,068	මහජන බැංකුව - යාපනය	11,388,824
-	ලංකා බැංකුව, කෝපරේට්	-
7,119,108	ලංකා බැංකුව, ලේක්වීව් ශාඛාව	2,346,995
34,797	කොමර්ෂල් බැංකුව, යූනියන් ප්ලේස්/යාපනය	34,797
9,762,088		14,071,116
	සටහන (7) -ප්‍රවර්තන නොවන වගකීම් - රු: 492,426,190	
492,426,190	මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු	492,426,190
492,426,190		492,426,190
	සටහන (8) - වෙළඳ හා වෙනත් ගෙවිය යුතු රු. 61,729,566	
46,293,045	ප්‍රධාන කාර්යාලය ගෙවිය යුතු	46,069,327
15,436,521	කන්කසන්තුරේ සිමෙන්ති කම්හල (යාපනය ශාඛාව)	16,785,357
61,729,566		62,854,684

2010		2011
	සටහන (9) ආදායම - රු. 656,071,402	
383,374,174	සිමෙන්ති විකුණුම් - කොළඹ	649,210,889
-	සිමෙන්ති විකුණුම් - යාපනය	-
27,334,174	කොන්ක්‍රීට් නිෂ්පාදන විකුණුම්	6,860,513
410,709,167		656,071,402
	සටහන (10) - විකුණුම් පිරිවැය - රු. 406,507,613	
382,500,524	සිමෙන්ති විකුණුම් පිරිවැය - කොළඹ	644,387,464
-	සිමෙන්ති විකුණුම් පිරිවැය - යාපනය	-
24,007,089	කොන්ක්‍රීට් නිපැයුම්හි නිෂ්පාදන පිරිවැය වන සෘජු කාර්යමණ්ඩල පිරිවැයද ඇතුලත් කර ඇත. (රු. 10,736,115)	12,288,400
406,507,613		656,675,864
	සටහන (11) - වෙනත් මෙහෙයුම් ආදායම් - රු.28,888,093/=	
	දේපළ කුලියට දීමෙන් ලැබුණු කුලී ආදායම	
22,855,842	ඉඩම් බදු දීම	22,713,936
	වත්කම් බැහැරලීම	-
	අබලි ද්‍රව්‍ය බැහැරලීම	-
5,011,917	තැන්පතු මත පොලී	2,418,587
	පුත්තලම සිමෙන්ති සමාගමට දී ඇති උපකරණ වලින් කුලී	-
261,261	සේවක ණයට අදාල පොලී	270,346
31,303	විවිධ	756,697
1,000,000	ලිහිසිතෙල්	3,500,000
5,685,540	මිල් පවර් ව්‍යාපෘතියට කුලියට දීම.	5,963,831
28,888,093		35,623,397
	සටහන (12) - බෙදාහැරීමේ පිරිවැය - නැත	
34,845,865	විකුණුම් සේවක වැටුප් ඇතුලත්ව යාපනය විකුණුම් ඒකකයේ වියදම්	

2010	සටහන (13) - පරිපාලන පිරිවැය - රු.29,131,025/=	2011
24,986,153	ප්‍රධාන කාර්යාලිය වියදම්	22,888,256
4,144,872	යාපනය කාර්යාලිය වියදම්	5,535,167
-	භාණ්ඩාගාරයට ගෙවූ අය බදු	-
29,131,029		28,423,423
	පහත සඳහන් දෑ ඇතුලත්ව පරිපාලන වියදම්	17,777,882
15,515,232	කාර්යමණ්ඩල වැටුප් ප්‍රතිලාභ සහ විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදන	120,000
120,000	විගණන ගාස්තු ප්‍රතිපාදන	2,464,309
1,509,091	වාහන නඩත්තු හා ධාවන වියදම්	561, 773
671,817	ක්ෂය	
	මාසික පාරිශ්‍රමිකය සකස් වී ඇති ආකාරය	
	රු. 45,000 - රු. 40,000 - 01 රු. 40,000 - රු. 35,000 - 01 රු. 35,000 - රු. 30,000 - 01 රු. 30,000 - රු. 25,000 - 27 රු. 25,000 - රු. 20,000 - 30 රු. 20,000 - රු. 15,000 - 4 රු. 15,000 - රු. 10,000 - - 64	
	සටහන (14) - වෙනත් මෙහෙයුම් වියදම් - රු. 3,995,281/=	
4,841,805	කොන්ක්‍රිට් නිෂ්පාදන ඒකකයේ සෘජු නොවන කාර්යමණ්ඩලයේ වැටුප් රු. 3,995,281/= ද ඇතුළත්ව එම ඒකකයට අදාල මෙහෙයුම් වියදම්	3,995,281
	සටහන (15) - අතිවිශේෂ අයිතමයන් නැත.	
	සටහන (16) - මෙම වාර්තාව සෑදීම සඳහා ව්‍යවහාර මුදල් ලෙස ශ්‍රී ලංකා රුපියල් භාවිතා කරන ලදී.	
	සටහන (17) - පාරිතෝෂික සඳහා වෙන් කිරීම පහත පරිදි වේ.	
20,806,963	විශ්‍රාමික පාරිතොෂික සඳහා වෙන්කිරීම් වල ආරම්භක ශේෂය	18,783,093
(3,458,813)	2011 වර්ෂයේදී සේවකයන් 03 දෙනෙකු සඳහා කල ගෙවීම්	1,249,433
17,348,150	2011.12.31 දිනට පවතින වෙන් කිරීම් ශේෂය	17,533,660
18,783,093	2011.12.31 දිනට සේවකයින් 64 දෙනෙකු සඳහා හිමි වෙන් කිරීම්	18,918,853
(1,434,943)	2011 වසරේදී වෙන් කිරීම්	(1,385,193)
	විශ්‍රාම පාරිතෝෂික සඳහා ඇති ප්‍රතිපාදන මුදල් මහා භාණ්ඩාගාර බිල්පත් වල තැන්පත් කර ඇත.	

සභාපති,
ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික සංස්ථා පනත සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සාමජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත 2012 මැයි 16 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශණ ප්‍රමාණාත්මක සාවධ්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය කීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරි බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.

(අ)	ප්‍රමිති 03 සහ 05	ඊආර්ආර්පී ව්‍යාපෘතිය යටතේ 1990 වර්ෂයේ මිලයට ගත් ට්‍රැක්ටර් 03ක් හා ටේලර් 03ක් මෝටර් සයිකල් 04ක්ද, රු.මිලියන 5.72ක් වටිනාකම වූ අමතර කොටස් තොගයක්ද, මිලදී ගත් දින සිට සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක්ම පුත්තලම හොල්සිම් ලංකා පුද්ගලික සමාගමේ තබා ඇති අතර, ඒවා ආපසු ලබාගෙන අගය කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.
(ආ)	ප්‍රමිති 18	(i)ප්‍රයෝජනයට යොදවාගෙන ඇති, අගය ක්ෂය කර අවසන් වූ වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. රු. ගොඩනැගිලි - ප්‍රධාන කාර්යාලය 2,607,500 ගෘහ භාණ්ඩ - යාපනය 648,494 මෝටර් වාහන - යාපනය 1,840,667 මෙවලම් යාපනය 855,533 (ii) වත්කම් ක්ෂය කිරීම අදාල වත්කම් භාවිතය සඳහා යෝග්‍ය වූ අවස්ථාවේ සිට ආරම්භ කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මිලට ගත් රු.4,285,714 ක් වටිනා මෝටර් රථ එම වර්ෂයේදී ක්ෂය කර නොතිබුණි.
(ඇ)	ප්‍රමිති 22	ආයෝජන ගිණුම් තැබීම ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.
(ඈ)	ප්‍රමිති 26	සීමාසහිත ලංකා සිමෙන්ති සමාගමේ කොටස් වලින 62.45% ක් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතුව පවතින අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ දීද ඒකාබද්ධ ගිණුම් පිළියෙල කර නොතිබුණි.

2.2.2 ගිණුම් තැබීමේ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.8,699,370ක් වූ ප්‍රධාන කාර්යාලායේ මෝටර් රථ සහ යාපනය කාර්යාලයේ සවිකිරීම් හා උපාංග රු.656,390ක් සඳහා 25%ක ක්‍රම ක්ෂය ප්‍රතිපත්තියක් තිබුණද, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්ෂය කර නොතිබුණි.

(ආ) ශේෂ පිරික්සුම හා ලෙජරය අතර රු.7,060,990ක වෙනසක්ද අවසන් ගිණුම හා ශේෂ පිරික්සුම අතර අයිතම 5ක එකතුව රු.305,017 ක වෙනසක් විය.

2.2.3 නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

විගණනයේ දී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

	නීති,රීති.රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව	අනුකූල නොවීම
(අ)	2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග සඳහා වෙනම ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ආ)	2003 ජූනි 02 දිනැති පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	සංයුක්ත සැලැස්ම, අයවැය ලේඛනය සහ කාර්යය සාධනය කාලීනව සමාලෝචනය කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළව එසේ කටයුතු කර නොතිබුණි.
	(ii)8.3.8 ඡේදය	සමාලෝචිත වර්ෂය තුල ලබා දී තිබූ රු. 95.000/- ක පරිත්‍යාග හා ආධාර සඳහා කැබිනට් අනුමැතිය ලබා ගෙන නොතිබුණි.
	(iii) 8.3.9 ඡේදය	රාජ්‍ය සංස්ථා, මණ්ඩලවල සම්පත් රේඛීය අමාත්‍යාංශයේ කටයුතු සඳහා ලබා නොගත යුතු නමුත් ඊට පටහැනිව රු. 4,800,000 කට මිළදී ගත් කැබ් රථය රේඛීය අමාත්‍යාංශයේ රාජකාරි සඳහා යොදවා තිබුණි.
(ඇ)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 ඡේදයේ (1වගන්තිය)	වගන්තිය ප්‍රකාරව සේවා ලබාගැනීමේදී අත්තිකාරම් ගෙවිය යුත්තේ ගිවිසුම්ගත මුදලින් 20%ක් පමණක් වුවද ඊට පටහැනිව එක්තරා පෞද්ගලික ආයතනයක් වෙත 45%ක් අත්තිකාරම් ගෙවා තිබුණි.

2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂ

විගණනයේ දී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවේ ණයගැති හා තැන්පත් ශේෂය රු. 76,971,520ක් වූ අතර කාල විශ්ලේෂණය අනුව රු.85,498,316ක් ලෙස දක්වා තිබුණි. මෙයින් වසර 1-2 අතර ශේෂය 34,047,371ක් ද වසර 2-5 අතර ශේෂය රු.18,546,294ක් ද, වර්ෂ 5කට වඩා වැඩි ශේෂය රු.8,232,978ක් ද විය. මේවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මුලු ණයහිමි හා උපචිත වියදම් ප්‍රමාණය රු.62,854,679ක් වූ අතර කාල විශ්ලේෂණය අනුව රු.63,078,398ක් ලෙස දක්වා තිබුණි. මෙයින් වසර 2-5 අතර ශේෂය රු.6,587,028 ක් ද, වර්ෂ 5කට වඩා වැඩි ශේෂය රු.5,822,619ක් ද විය. මේවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.3,859,719ක මුදලක් වර්ෂ 09ක කාලයක සිට හිඟ හිට තිබූ අතර එය අය කර ගැනීමට නොහැකිව තිබුණි.

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.

එකතුව රු.1,840,678,590ක්වූ විෂයයන් 7කට අදාළ ශේෂ තහවුරු කර ගැනීමට අවශ්‍ය වූ ස්ථාවර වත්කම් ලේඛන, සවිස්තරාත්මක උපලේඛන තැන්පතු සහතික හා සනාථ කිරීම් ආදිය විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය/සත්‍යාක්ෂණය කළ නොහැකි විය.

3. මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන වලට අනුව සමාලෝචිත වර්ෂයේ සංස්ථාව විසින් රු.2,600,231 ක ශුද්ධ ලාභයක් ලබා ඇති අතර, ඉකුත් වර්ෂයේ ලබා ඇති ශුද්ධ ලාභය රු.5,074,585ක් විය. ඒ අනුව පසුගිය වර්ෂය හා සසඳන කල මෙහෙයුම් ප්‍රතිඵලයේ 49%ක පිරිහීමක් පෙන්නුම් කර තිබුණි.

විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ තත්‍ය මෙහෙයුම් ලාභය රු.181,644ක් විය. කෙසේ වුවද ස්ථාවර තැන්පතු පොලී හා මෙහෙයුම් නොවන ආදායම් වලින් ලද රු.2,418,587 ක ආදායම් නිසා මෙම ලාභය රු.2,600,231 දක්වා වර්ධනය වී තිබුණි.

(ආ) පසුගිය වර්ෂයේ විකුණුම් හා සසඳන කල සමාලෝචිත වර්ෂයේ විකුණුම් 60%කින් වැඩි වී තිබුණද විකුණුම් පිරිවැය වැඩි වී තිබීම නිසා රු.604,462 ක දළ අලාභයක් පෙන්නුම් කෙරුණි. අනෙකුත් මෙහෙයුම් ආදායම් රු.33,204,810ක් වීම නිසාත්, ස්ථාවර නිෂ්පාදන පිරිවැය රු.32,418,704ක් වීම නිසාත් වසරේ මෙහෙයුම් ලාභය රු.181,644ක් තිබුණි.

4. මෙහෙයුම් සමලෝචනය

කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල සිමෙන්ති මෙට්‍රික් ටොන් 58,352ක් එනම් සිමෙන්ති බෑග් 1,167,040ක් ආනයනය කර තිබුණි. මෙයින් බෑග් 21,088 ක් පලුදුව තිබූ අතර, බෑග් 233ක් අස්ථාන ගත වී තිබුණි. මෙම බෑග් අස්ථානගත වීමට හේතු අනාවරණය කරගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මුලු විකුණුම් ප්‍රමාණය රු.656,071,402 ක් වූ අතර විකුණුම් පිරිවැය රු.656,675,864 ක් වූයෙන් දල අලාභය රු.604,462ක් වී තිබුණි.

(ඇ)සමාලෝචිත වර්ෂයේ කන්කසන්තුරෙහි සිමෙන්ති කොන්ක්‍රීට් නිෂ්පාදන හා අලෙවි අංශයේ විකුණුම් ආදායම රු.7,879,064ක් වූ අතර පෙර වර්ෂය හා සසඳන කල 74%කින් විකුණුම් අඩු වී තිබුණි. මෙම අංශයේ ශුද්ධ විකුණුම් රු.6,860,513ක් වූ අතර විකුණුම් පිරිවැය රු.12,288,400ක් වීම නිසා දල අලාභය රු.5,427,887ක් විය. දල අලාභය පෙර වසර හා සසඳන කල 258%ක වැඩි වීමක් පෙන්නුම් කෙරුණි.

එම දල අලාභය අනෙකුත් පරිපාලන වියදම් රු.3,995,281 ක් දැරූ පසු රු.9,423,167 ක ශුද්ධ අලාභයක් දක්වා වර්ධනය වී තිබුණි. පෙර වසර අලාභය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ අලාභය 31006% දක්වා වර්ධනය වී තිබුණි.

දිගින් දිගටම අලාභ ලබමින් පැවතියද මෙම අංශයේ වාර්ෂක ප්‍රසාද දීමනා ලෙස රු.196,000ක් සේවකයින්ට ගෙවා තිබුණි. නමුත් කන්කේෂන් කොන්ක්‍රීට් අංශය පසුගිය වර්ෂ 5 තුළ උපයා ඇති අලාභය රු.මිලියන 1 සිට රු.මිලියන 20ක අතර පරාසයක විය.

(ඇ) වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුලදී මෙට්‍රික් ටොන් 127,500 ක විකුණුම් ඉලක්ක කර තිබුණි. නමුත් තථ්‍ය විකුණුම් මෙට්‍රික් ටොන් 58,352 ක් විය. කිසිදු මාසයක අපේක්ෂිත ඉලක්ක කරා ලඟා වීමට නොහැකි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ මුලු අපේක්ෂිත විකුණුම් වලින් ලඟාකර ගෙන තිබුණේ 46%ක් පමණි.

කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ ප්‍රධාන කාර්යාලයේ රු.9,802,984 ක් වූ වැට් බදු ගණුදෙනුකරුවන්ගෙන් අයකර ගෙන දේශීය ආදායම් කොමසාරිස් වෙත ගෙවීම් කර නොතිබුණි.

(ආ) දේශීය ආදායම් කොමසාරිස් සහ පළාත් ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කළයුතු රු.16,562,261 ක බදු මුදල් ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් අක්කර 5,352 ක් වූ ආරුවක්කාලු පිහිටි හුණුගල් නිධිය 1995 වර්ෂයේදී සිමෙන්ති නිෂ්පාදනය සඳහා හුණුගල් හාරා ගැනීමට පෞද්ගලික සමාගමකට වසර 50 කට බදු දී තිබුණි. ගිවිසුමට අනුව වසර 50 තුලම කුලී සංශෝධනයන් කිරීමේ වගන්තියක් ඇතුළත් කර නොතිබුණි. මේ නිසා 2011 අගෝස්තු 16 දින පැවැති පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී මෙම හුණුගල් නිධිය පිළිබඳ බදු ගිවිසුම සංශෝධනය කිරීමට උපදෙස් දුන් නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඈ) පුත්තලම පලාවිහී කල්ලඩි වල ඇති සංස්ථාව සතු අක්කර 180 ක ඉඩම ඵලදායි කාර්යයක යෙදවීමකින් තොරව නිෂ්ක්‍රීයව තිබුණි.

(ඉ) 2003 වර්ෂයේ ණය පදනම මත සිමෙන්ති මලු 5,100 ක් සඳහා විකුණුම් නියෝජිතවරයෙකු ලබාදුන් චෙක්පත් අගරු වීම මත රු. 1,656,000 ක මුදලක් සංස්ථාවට අයවිය යුතුව තිබුණි. එම මුදල හා ඊට අදාල නෛයිතික පොලියද සමඟ අයකර ගැනීම සඳහා සංස්ථාව 2008 පෙබරවාරි 11 දින නඩු පවරා තිබුණි. නඩු තීන්දු වල තීරණ මත නියෝජිතයාගේ භාණ්ඩ ද දේපල ද අධිකරණ තහනමට ගන්නා ලද නමුදු මෙම දේපළ වෙන්දේසි කර සංස්ථාවට වසර 09ක සිට හිඟහිට පවතින මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) රු.1,083,618,910 ක මුදලක් සිමෙන්ති සමාගමක ආයෝජනය කර තිබූ අතර වසර 14කට අධික කාලයක සිට සමාලෝචිත වර්ෂය දක්වාම සංස්ථාවට කිසිඳු ප්‍රතිලාභයක් ලැබී නොතිබිණි.

(උ) පෞද්ගලික සමාගමක ආයෝජනය කර තිබූ රු.4,800,000 ක මුදල සඳහා 2004 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම කිසිඳු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

හඳුනාගත් පාඩු

2011 වර්ෂය තුල අවස්ථා 6කදී රු.1,167,122 ක මුදලක් සංස්ථාව විසින් ප්‍රමාද ගාස්තු ලෙස ගෙවා තිබුණි. රේගු වැඩ වර්ජන හේතුවෙන් මෙම පුමාද ගාස්තු ගෙවීමට සිදු වූ බව මණ්ඩලයේ සභාපතිවරයා මා වෙත දන්වා තිබුණි.

කාර්ය මණ්ඩල පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංස්ථාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර 2009 සැප්තැම්බර් 08 දින සිටද, ගණකාධිකාරි තනතුර 2010 සැප්තැම්බර් සිටද පුරප්පාඩුව පවතින අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මෙම තනතුර පුරවා ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණක, විකුණුම් නිලධාරි, පිරිස් නිලධාරි, සැපයුම් නිලධාරි හා ගණකාධිකාරි යන මාණ්ඩලික තනතුරු 5 සඳහාම වැඩබලන (Acting) නිලධාරින් පත්කර තිබුණි. අනුමත කාර්යය මණ්ඩලය තුළ 2011 ඔක්තෝම්බර් 31 දින දක්වා පවතින තනතුරු පුරප්පාඩු පිරවීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2011 නොවැම්බර් 15 දිනැති ලිපියෙන් අනුමැතිය දී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් මේ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරි සැලැස්ම

2011 වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්ම සංස්ථාව විසින් පිළියෙල කර තිබුණද, සංයුක්ත සැලැස්ම කාර්යයන් පදනම් කරගෙන එය සංශෝධනය කර නොතිබුණි. 2011-2015 වර්ෂ පහ වෙනුවෙන් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණු අතර එහි සඳහන් මෙහෙවර, දැක්ම හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි.

අයවැය ලේඛනමය පාලනය

අයවැයගත ආදායම්, වියදම් සහ තථ්‍ය ආදායම්, වියදම් අතර සැලකිය යුතු විචලනයක් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. අයවැයගත සංඛ්‍යා හා තථ්‍ය සංඛ්‍යා අතර වෙනසෙහි ප්‍රතිශතය 1% සිට 95% දක්වා පරාසයක් පැවතුණි.

6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයා වෙත දන්වා යවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ඉලක්ක සමඟ මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

(ආ) ණය ගැතියන් හා ණය හිමියන්

(ඇ) ඉන්වෙන්ට්‍රි ලේඛණ පවත්වා ගැනීම

(ඉ) වත්කම් පාලනය හා ලේඛන පවත්වාගෙන යාම

(ඊ) බැංකු ගිණුම් පවත්වාගෙන යාම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) ප්‍රමිති 03 සහ 05ඊආර්ආර්පී ව්‍යාපෘතිය යටතේ 1990 වර්ෂයේ මිලයට ගත් ට්‍රැක්ටර් 03ක් හා ටේලර් 03ක් මෝටර් සයිකල් 04ක්ද, රු.මිලියන 5.72ක් වටිනාකම වූ අමතර කොටස් තොගයක්ද, මිලදී ගත් දින සිට සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක්ම පුත්තලම හොල්සිම් ලංකා පුද්ගලික සමාගමේ තබා ඇති අතර, ඒවා ආපසු ලබාගෙන අගය කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) (i) ප්‍රමිති 18 ප්‍රයෝජනයට යොදවාගෙන ඇති,අගය ක්ෂය කර අවසන් වූ වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

	රු.
ගොඩනැගිලි - ප්‍රධාන කාර්යාලය	2,607,500
ගෘහ භාණ්ඩ - යාපනය	648,494
මෝටර් වාහන - යාපනය	1,840,667
මෙවලම් යාපනය	855,533

(ii) ප්‍රමිති 18 වත්කම් ක්ෂය කිරීම අදාල වත්කම් භාවිතය සඳහා යෝග්‍ය වූ අවස්ථාවේ සිට ආරම්භ කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මිලට ගත් රු.4,285,714 ක් වටිනා මෝටර් රථ එම වර්ෂයේදී ක්ෂය කර නොතිබුණි.

(ඇ) ප්‍රමිති 22 ආයෝජන ගිණුම් තැබීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) ප්‍රමිති 26 සීමාසහිත ලංකා සිමෙන්ති සමාගමේ කොටස් වලින 62.45% ක් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතුව පවතින අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ දීද ඒකාබද්ධ ගිණුම් පිළියෙල කර නොතිබුණි.

(අ) ට්‍රැක්ටර් 3 හොල්සිම් සමාගම වෙතින් ගෙන යාපනය කොන්ක්‍රීට් අංගනයේ කටයුතු සඳහා යොදවා ගෙන ඇත. සිමෙන්ති සංස්ථාවේ ටේලර් 3 සඳහා හොල්සිම් සමාගම විසින් අලුත්ම ටේලර් 2ක් ලබාදෙන ලදී. මෝටර් සයිකල් 4 සහ රු.මිලියන 5.72ක් වටිනාකම වූ අමතර කොටස් තවමත් හොල්සිම් සමාගමේ තබා ඇත. එම ආයතනයෙන්ද ටෙන්ඩර් කැඳවා වැඩිම ඉල්ලුම්කරුට ලබා දීමට කටයුතු කරමි.

(ආ) (i) අගය ක්ෂය කර අවසන් වූ වත්කම් 2012 වසරේ සිට නැවත ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කරමි.

(ii) වත්කම් භාවිතය සඳහා යෝග්‍ය වූ අවස්ථාවේ සිට ක්ෂය කිරීමට මේ වසරේ සිට පියවර ගතිමි.

(ඇ) ආයෝජන ගිණුම් තැබීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට පියවර ගතිමි.

(ඈ) 2012 වසරේ සිට ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කරමි.

2.2.2 ගිණුම් තැබීමේ අඩුපාඩු පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.	
(අ) රු.8,699,370ක් වූ ප්‍රධාන කාර්යාලායේ මෝටර් රථ සහ යාපනය කාර්යාලයේ සවිකිරීම් හා උපාංග රු.656,390ක් සඳහා 25%ක ක්‍රම ක්ෂය ප්‍රතිපත්තියක් තිබුණද, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්ෂය කර නොතිබුණි.	(අ) ක්ෂය ප්‍රතිපත්තිය අනුව මෙම වසරේ සිට ක්ෂය කිරීමට පියවර ගතිමි.
(ආ) ශේෂ පිරික්සුම හා ලෙජරය අතර රු.7,060,990ක වෙනසක්ද අවසන් ගිණුම හා ශේෂ පිරික්සුම අතර අයිතම 5ක එකතුව රු.305,017 ක වෙනසක් විය.	(ආ) 2012 වසරේ සිට ජර්නල් සටහන් ප්‍රමාණය අඩු කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට පියවර ගතිමි.
2.2.3 නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම විගණනයේ දී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ	
(අ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග සඳහා වෙනම ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.	(අ) මෙම වසරේ සිට ගෙවීම් වවුචර් විගණකාධිපති වෙත එවීමට කටයුතු සලස්වමි.
(ආ) (i) 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 4.2.2 වගන්තිය සංයුක්ත සැලැස්ම, අයවැය ලේඛනය සහ කාර්යය සාධනය කාලීනව සමාලෝචනය කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළව එසේ කටයුතු කර නොතිබුණි.	(ආ) (i) සංයුක්ත සැලැස්ම, අයවැය ලේඛනය සහ කාර්යය සාධනය කාලීනව සමාලෝචනය කිරීමට මේ වසරේ සිට පියවර ගනිමි.
(ii) 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 8.3.8 ඡේදය සමාලෝචිත වර්ෂය තුල ලබා දී තිබූ රු. 95.000/- ක පරිත්‍යාග හා ආධාර සඳහා කැබිනට් අනුමැතිය ලබා ගෙන නොතිබුණි.	(ii) මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබාගෙන ඇත. ඉදිරියේදී පරිත්‍යාගයක් සිදුකිරීමේදී කැබිනට් අනුමැතිය ලබා ගැනීමට පියවර ගනිමි.

මෙයින් වසර 2-5 අතර ශේෂය රු.6,587,028 ක් ද, වර්ෂ 5කට වඩා වැඩි ශේෂය රු.5,822,619ක් ද විය. මේවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 8.3.9 ඡේදය රාජ්‍ය සංස්ථා, මණ්ඩලවල සම්පත් රේඛීය අමාත්‍යාංශයේ කටයුතු සඳහා ලබා නොගත යුතු නමුත් ඊට පටහැනිව රු. 4,800,000 කට මිළදී ගත් කැබ් රථය රේඛීය අමාත්‍යාංශයේ රාජකාරි සඳහා යොදවා තිබුණි.

(iii) එම කැබ් රථය යාපනය කොන්ක්‍රීට් අංගනයේ කටයුතු සඳහා භාවිතා කිරීමට දැනටමත් කටයුතු සූදානම් කර ඇත.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 ඡේදයේ (1වගන්තිය) වගන්තිය ප්‍රකාරව සේවා ලබාගැනීමේදී අත්තිකාරම් ගෙවිය යුත්තේ ගිවිසුම්ගත මුදලින් 20%ක් පමණක් වුවද ඊට පටහැනිව එක්තරා පෞද්ගලික ආයතනයක් වෙත 45%ක් අත්තිකාරම් ගෙවා තිබුණි.

(ඇ) අපගේ ගබඩාව හිටි හැටියේම බී.සී.සී වත්තෙන් ගරු ආරක්ෂක ලේකම්තුමාගේ නියෝගයක් මත වෙනත් ස්ථානයකට ගෙන යාමට සිදු වූ අවස්ථාවේ අපගේ පාරිභෝගිකයන් හට නව ගබඩා සංකීර්ණය සොයා ගැනීමට අපහසු වූ නිසා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව, මිල කැඳවීමෙන් අනතුරුව බඩු මිලදී ගැනීමට විශාල මුදලක් යන බැවින් 45% ක අත්තිකාරම් මුදලක් ගෙවන ලදී.

2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂ

විගණනයේ දී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවේ ණයගැති හා තැන්පත් ශේෂය රු. 76,971,520ක් වූ අතර කාල විශ්ලේෂණය අනුව රු.85,498,316ක් ලෙස දක්වා තිබුණි. මෙයින් වසර 1-2 අතර ශේෂය 34,047,371ක් ද වසර 2-5 අතර ශේෂය රු.18,546,294ක් ද, වර්ෂ 5කට වඩා වැඩි ශේෂය රු.8,232,978ක් ද විය. මේවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(අ) මෙම කාල විශ්ලේෂණය නිවැරදි නොවන බැවින් නිවැරදි කාල විශ්ලේෂණය එවීමට කටයුතු කරමි. වසර 5ට වැඩි ශේෂ නිරවුල් කිරීමට නීතිමය පියවර ගන්නා ලදී. වසර 2-5ත් අතර ණය ගැතියන් දැනටමත් ගෙවීම් කරමින් පවතී.

(ආ) සමාලෝචිත වර්ෂයේ මුලු ණයහිමි හා උපචිත වියදම් ප්‍රමාණය රු.62,854,679ක් වූ අතර කාල විශ්ලේෂණය අනුව රු.63,078,398ක් ලෙස දක්වා තිබුණි.

(ආ) මේවා නිරවුල් කිරීමට කටයුතු සම්පාදනය කරමින් පවතී.

පහත නිරීක්ෂණයන් කෙරේ.

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.

එකතුව රු.1,840,678,590ක්වූ විෂයයන් 7කට අදාළ ශේෂ තහවුරු කර ගැනීමට අවශ්‍ය වූ ස්ථාවර වත්කම් ලේඛන, සවිස්තරාත්මක උපලේඛන තැන්පතු සහතික හා සනාථ කිරීම් ආදිය විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය/සත්‍යාපනය කළ නොහැකි විය.

මෙම ස්ථාවර වත්කම් ලේඛන, සවිස්තරාත්මක උපලේඛන තැන්පතු සහතික හා සනාථ කිරීම් ආදිය විගණනයට ඉදිරිපත් කිරීමට පියවර ගනිමි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන වලට අනුව සමාලෝචිත වර්ෂයේ සංස්ථාව විසින් රු.2,600,231 ක ශුද්ධ ලාභයක් ලබා ඇති අතර, ඉකුත් වර්ෂයේ ලබා ඇති ශුද්ධ ලාභය රු.5,074,585ක් විය. ඒ අනුව පසුගිය වර්ෂය හා සසඳන කල මෙහෙයුම් ප්‍රතිඵලයේ 49%ක පිරිහීමක් පෙන්නුම් කර තිබුණි.

රජය විසින් 2011 වසරේ ඩොලරයේ අගය ඉහල දැමීමත් සමඟ සිමෙන්ති ආනයනය ගාස්තු ඉහල යාමෙන් සිමෙන්ති ගෙන්වීමේ පිරිවැය ඉහල යන ලදී. නමුත් තරඟකරුවන්ගේ සිමෙන්ති වෙළඳපල මිල පහල මට්ටමක තිබූ බැවින් සිමෙන්ති විකුණුම් මිලද ඉහල දැමීමට නොහැකි විය. එබැවින් 2011 වසරේ මෙහෙයුම් ප්‍රතිඵලයේ පිරිහීමක් ඇති විය.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ තත්‍ය මෙහෙයුම් ලාභය රු.181,644ක් විය. කෙසේ වුවද ස්ථාවර තැන්පතු පොලී හා මෙහෙයුම් නොවන ආදායම් වලින් ලද රු.2,418,587 ක ආදායම් නිසා මෙම ලාභය රු.2,600,231 දක්වා වර්ධනය වී තිබුණි.

සමාලෝචිත වසරේ ඩොලරයේ ඉහළ යාමත් සමඟ ඇති වූ අලාභය හේතුවෙන් සමාලෝචිත වසරේ මෙහෙයුම් ලාභය අඩු වී ඇත.

(ආ) පසුගිය වර්ෂයේ විකුණුම් හා සසඳන කල සමාලෝචිත වර්ෂයේ විකුණුම් 60%කින් වැඩි වී තිබුණද විකුණුම් පිරිවැය වැඩි වී තිබීම නිසා රු.604,462 ක දළ අලාභයක් පෙන්නුම් කෙරුණි. අනෙකුත් මෙහෙයුම් ආදායම් රු.33,204,810ක් වීම නිසාත්, ස්ථාවර නිෂ්පාදන පිරිවැය රු.32,418,704ක් වීම නිසාත් වසරේ මෙහෙයුම් ලාභය රු.181,644ක් තිබුණි.

පූර්ව වසර සමඟ සැසඳීමේදී 2011 වසරේ විකුණුම් වල වැඩිවීමක් පෙන්නුම් කරයි. 2011 වසරේ අග භාගයේ ඩොලරයේ මිල ඉහල යාමත් සමඟ විකුණුම් පිරිවැයද ඉහල ගොස් ඇත. විකුණුම් පිරිවැය වැඩි

වුවද සිමෙන්ති වෙළඳපොලේ අනිකුත් තරඟකරුවන්ගේ මිල ගණන් අඩු මට්ටමක පැවති බැවින් ඉහළ විකුණුම් මිලක් තීරණය කිරීම අපහසු වී ඇත. එබැවින් බදු වලට පෙර ලාභය අඩු වීමට බලපා ඇත. ඉහත හේතුවට දළ ලාභය අලාභයක් බවට පත්වීමට බලපාන ලදී.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල සිමෙන්ති මෙට්‍රික් ටොන් 58,352ක් එනම් සිමෙන්ති බෑග් 1,167,040ක් ආනයනය කර තිබුණි. මෙයින් බෑග් 21,088 ක් පලුදුව තිබූ අතර, බෑග් 233ක් අස්ථාන ගත වී තිබුණි. මෙම බෑග් අස්ථානගත වීමට හේතු අනාවරණය කරගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මුලු විකුණුම් ප්‍රමාණය රු.656,071,402 ක් වූ අතර විකුණුම් පිරිවැය රු.656,675,864 ක් වූයෙන් දල අලාභය රු.604,462ක් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ කන්කසන්තුරෙහි සිමෙන්ති කොන්ක්‍රීට් නිෂ්පාදන හා අලෙවි අංශයේ විකුණුම් ආදායම රු.7,879,064ක් වූ අතර පෙර වර්ෂය හා සසඳන කල 74%කින් විකුණුම් අඩු වී තිබුණි. මෙම අංශයේ ශුද්ධ විකුණුම් රු.6,860,513ක් වූ අතර විකුණුම් පිරිවැය රු.12,288,400ක් වීම නිසා දල අලාභය රු.5,427,887ක් විය. දල අලාභය පෙර වසර හා සසඳන කල 258%ක වැඩි වීමක් පෙන්නුම් කෙරුණි.

එම දල අලාභය අනෙකුත් පරිපාලන වියදම් රු.3,995,281 ක් දැරූ පසු රු.9,423,167 ක ශුද්ධ අලාභයක් දක්වා වර්ධනය වී තිබුණි. පෙර වසර අලාභය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ අලාභය 31006% දක්වා වර්ධනය වී තිබුණි.

දිගින් දිගටම අලාභ ලබමින් පැවතියද මෙම අංශයේ වාර්ෂක ප්‍රසාද දීමනා ලෙස රු.196,000ක් සේවකයින්ට ගෙවා තිබුණි. නමුත් කන්කේෂන් කොන්ක්‍රීට් අංශය පසුගිය වර්ෂ 5 තුළ උපයා ඇති අලාභය රු.මිලියන 1 සිට රු.මිලියන 20ක අතර පරාසයක විය.

(අ) සමහර අවස්ථාවන්හිදී කන්ටේනරයට බෑග් 560ක් තිබිය යුතු වුවද බෑග් 1ක් හෝ 2ක් සමහර අවස්ථාවන්හිදී හිඟව ලැබේ.

(ආ) රජය විසින් ඩොලරයේ අගය ඉහල දැමීමත් සහ ඉන්ධන මිල ඉහල යෑමෙන් ඇති වූ ප්‍රවාහන ගාස්තු වැඩි විමත් සමඟ ඩොලරයේ අගය ඉහල ගිය බැවින් විකුණුම් පිරිවැය ඉහල යන ලදී.

(ඇ) කොන්ක්‍රීට් කණු නිෂ්පාදන අංගනයෙහි යුද්ධ සමයේ සිට වසර 25ට වඩා වැඩි කාලයක් සේවය කරන සේවක පිරිසක් සිටින අතර ඔවුනගේ වැටුප් අර්ථසාධක අරමුදල් සහ අනිකුත් වියදම් දැරීම නිසා පිරිවැය ඉහල යමින් පවතී.

2011 වසරේ සිමෙන්ති සංස්ථා කර්මාන්තශාලා භූමියෙන් පිටත පිහිටි කොන්ක්‍රීට් අංගනය කර්මාන්තශාලා භූමියට ගෙනයන ලදී. එබැවින් ඒ සඳහා වැඩි ප්‍රවාහන වියදමක් දැරීමට සිදුවිය.

දිවා රෑ නොබලා කොන්ක්‍රීට් නිපැයුම් සිදුකරන සේවකයන් හට මෙම වාර්ෂික ප්‍රසාද දීමනාව ගගෙවන ලදී.

වීම මත රු. 1,656,000 ක මුදලක් සංස්ථාවට අයවිය යුතුව තිබුණි. එම මුදල හා ඊට අදාල නෛයිතික පොලියද සමඟ අයකර ගැනීම සඳහා සංස්ථාව 2008 පෙබරවාරි 11 දින නඩු පවරා තිබුණි. නඩු තීන්දු වල තීරණ මත නියෝජිතයාගේ භාණ්ඩ ද දේපල ද අධිකරණ තහනමට ගන්නා ලද නමුදු මෙම දේපළ වෙන්දේසි කර සංස්ථාවට වසර 09ක සිට හිඟහිට පවතින මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.2 කළමණාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ ප්‍රධාන කාර්යාලයේ රු.9,802,984ක් වූ වැට් බදු ගණුදෙනුකරුවන්ගෙන් අයකර ගෙන දේශීය ආදායම් කොමසාරිස් වෙත ගෙවීම් කර නොතිබුණි.

මෙම මුදල හිලව් නොකළ යෙදවූ බදු ප්‍රමාණය වන අතර එය මාසිකව ගෙවිය යුතු බදු වලින් අඩු කර ගැනීමට පියවර ගනිමු.

(ආ) දේශීය ආදායම් කොමසාරිස් සහ පළාත් ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කළයුතු රු.16,562,261 ක බදු මුදල් ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

වැට් බදු මුදල්, ජා.ගො.බදු.මු: ආ.යෝ ගාස්තු ගෙවා නිම කිරීමට කටයුතු යොදා ඇත. ව්‍යාපාර පිරිවැටුම් බදු වසර ගණනාවක සිට හිඟ හිට ඇති බැවින් අර්බුද පැවති බැවින් හිඟ මුදල් ගෙවා නිම කිරීමට අපහසු වී ඇත.

(ඇ) ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් අක්කර 5,352 ක් වූ ආරුවක්කාලු පිහිටි හුණුගල් නිධිය 1995 වර්ෂයේදී සිමෙන්ති නිෂ්පාදනය සඳහා හුණුගල් හාරා ගැනීමට පෞද්ගලික සමාගමකට වසර 50 කට බදු දී තිබුණි. ගිවිසුමට අනුව වසර 50 තුලම කුලී සංශෝධනයන් කිරීමේ වගන්තියක් ඇතුළත් කර නොතිබුණි. මේ නිසා 2011 අගෝස්තු 16 දින පැවැති පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී මෙම හුණුගල් නිධිය පිළිබඳ බදු ගිවිසුම සංශෝධනය කිරීමට උපදෙස් දුන් නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

දැනටමත් මෙම ගිවිසුම අලුත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් පවතී.

(ඈ) පුත්තලම පලාවිහී කල්ලඩි වල ඇති සංස්ථාව සතු අක්කර 180 ක ඉඩම ඵලදායි කාර්යයක යෙදවීමකින් තොරව නිෂ්ක්‍රීයව තිබුණි.

දැනට මෙම ඉඩමේ යම් වගා කටයුත්තක් සිදු කිරීමට කටයුතු සම්පාදනය කර ඇත.

(ඉ) 2003 වර්ෂයේ ණය පදනම මත සිමෙන්ති මලු 5,100ක් සඳහා විකුණුම් නියෝජිතවරයෙකු ලබාදුන් චෙක්පත් අගරු

රක්ෂණ මුදල් ලබා ගැනීම සඳහා 2011 ජූනි 6 වන දින ඉල්ලුම් කර ඇති අතර දැනට ඒ පිළිබඳ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.

තිබුණි. අනුමත කාර්යය මණ්ඩලය තුළ 2011 ඔක්තෝම්බර් 31 දින දක්වා පවතින තනතුරු පුරප්පාඩු පිරවීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2011 නොවැම්බර් 15 දිනැති ලිපියෙන් අනුමැතිය දී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් මේ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) රු.1,083,618,910 ක මුදලක් සිමෙන්ති සමාගමක ආයෝජනය කර තිබූ අතර වසර 14කට අධික කාලයක සිට සමාලෝචිත වර්ෂය දක්වාම සංස්ථාවට කිසිඳු ප්‍රතිලාභයක් ලැබී නොතිබිණි.

පැහැදිලි කිරීම් නැත.

(උ) පෞද්ගලික සමාගමක ආයෝජනය කර තිබූ රු.4,800,000 ක මුදල සඳහා 2004 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම කිසිඳු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

මෙම දේපළ රාජසන්තක කර අයවිය යුතු මුදල අයකර ගැනීමට කටයුතු සලස්වා ඇත.

4.3 හඳුනාගත් පාඩු

2011 වර්ෂය තුල අවස්ථා 6කදී රු.1,167,122 ක මුදලක් සංස්ථාව විසින් ප්‍රමාද ගාස්තු ලෙස ගෙවා තිබුණි. රේගු වැඩ වර්ජන හේතුවෙන් මෙම පුමාද ගාස්තු ගෙවීමට සිදු වූ බව මණ්ඩලයේ සභාපතිවරයා මා වෙත දන්වා තිබුණි.

රේගු වැඩ වර්ජන හේතුවෙන් මෙම ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදුවිය.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංස්ථාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර 2009 සැප්තැම්බර් 08 දින සිටද, ගණකාධිකාරි තනතුර 2010 සැප්තැම්බර් සිටද පුරප්පාඩුව පවතින අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මෙම තනතුර පුරවා ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

මෙම සියලුම තනතුරු අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

(ආ) අභ්‍යන්තර විගණක, විකුණුම් නිලධාරි, පිරිස් නිලධාරි, සැපයුම් නිලධාරි හා ගණකාධිකාරි යන මාණ්ඩලික තනතුරු 5සඳහාම වැඩබලන (Acting) නිලධාරින් පත්කර

එම

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

(ඊ) බැංකු ගිණුම් පවත්වාගෙන යාම

5.1 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරි සැලැස්ම

2011 වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්ම සංස්ථාව විසින් පිළියෙල කර තිබුණද, සංයුක්ත සැලැස්ම කාර්යයන් පදනම් කරගෙන එය සංශෝධනය කර නොතිබුණි. 2011-2015 වර්ෂ පහ වෙනුවෙන් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණු අතර එහි සඳහන් මෙහෙවර, දැක්ම හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි.

2012 වසරේ එය සංශෝධනය කිරීමට පියවර ගනිමු.

5.2 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත ආදායම්, වියදම් සහ තථ්‍ය ආදායම්, වියදම් අතර සැලකිය යුතු විචලනයක් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. අයවැයගත සංඛ්‍යා හා තථ්‍ය සංඛ්‍යා අතර වෙනසෙහි ප්‍රතිශතය 1% සිට 95% දක්වා පරාසයක් පැවතුණි.

2012 වසරේදී අයවැය ලේඛනය ඵලදායි කළමනාකරන පාලන කාරකයන් ලෙස උපයෝගී කරගැනීමට කටයුතු කරමි.

6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයා වෙත දන්වා යවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ඉලක්ක සමඟ මූල්‍ය හා භෞතික කාර්ය සාධනය
(ආ) ණය ගැතියන් හා ණය හිමියන්
(ඇ) ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වා ගැනීම
(ඉ) වත්කම් පාලනය හා ලේඛන පවත්වාගෙන යාම